**බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව - 2023**

**--------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2023 දෙසැම්බර් 31 දිනට බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින්  විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන්, අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ  ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාග්ධනිත කළ නොහැකි අයහාර වියදම්වල එකතුව වූ රු.3,922,152 ක් ඉඩම් හා ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කර තිබුණි. | 2024 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වියදම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | ලැබිය යුතු හා බිල්කළ යුතු මුද්දර ගාස්තු ආදායම පිළිවෙළින් රු.3,231,216 ක් හා රු.3,095,766 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2024 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | ඉකුත් වර්ෂයේදී බෙලිඅත්ත කොටියාගොඩැල්ල ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීම වෙනුවෙන් ගෙවීම් කර තිබූ රු.1,669,959 ක ප්‍රාග්ධන වියදම ඉඩම් හා ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | 2024 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | ප්‍රාග්ධන වියදම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | එකතු වටිනාකම රු.1,393,592 ක් වූ තොග අයිතම 24 ක් යන්ත්‍ර හා උපකරණ සහ ලී බඩු හා සවි කිරීම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | 2024 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | තොගය නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | ඉකුත් වර්ෂයන්ට අදාළ රු.1,195,766 ක පෙරසැරි තැන්පත් මුදල් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කිරීම නිසා සේවා ගාස්තු ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි. | 2024 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | 2017 වර්ෂයේදී මිලදී ගෙන තිබූ කළමනාකරණ තොරතුරු පද්ධති 04 ක එකතු වටිනාකම වූ රු.720,000 ක් අස්පෘශ්‍ය වත්කම් ලෙස ගිණුම්ගත නොකර යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ යටතේ ගිණුම්ගත කර තිබුණි. | 2024 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (උ) | ආපසු නොගෙවන පුස්තකාල තැන්පත් රු.545,150 ක් ආදායමක් ලෙස ගිණුම්ගත නොකර තැන්පත් ලෙස ගිණුම්ගත කර තිබුණි. | වසර 05 ට වැඩි පුස්තකාල තැන්පත් ශේෂය ආදායමට ගැනීමට කටයුතු කරන බව | ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඌ) | ස්ථාවර තැන්පතුවල වටිනාකම රු.470,318 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | 2024 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | ස්ථාවර තැන්පතු වටිනාකම නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (එ) | තොග අයිතමයන් 08 ක එකතු වටිනාකම රු.130,338 ක් අඩුවෙන් හා තොග අයිතමයන් 05 ක එකතු වටිනාකම රු.21,345 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | 2024 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | තොගය නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඒ) | වැඩිපුර ප්‍රතිපූර්ණය කර තිබූ මන්ත්‍රී දීමනා වියදම් රු.94,306 ක් ගෙවිය යුතු ශේෂයක් ලෙස හා පිරිවැය රු.73,120 ක් වූ කොම්පෝස්ට් තොගය අතැති තොගයක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | 2024 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | ගෙවිය යුතු ශේෂයන් හා අවසන් තොගය නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඔ) | එකතු වටිනාකම රු.105,000 ක 120L කසළ බඳුන් 06 ක් සහ රු.69,580 ක 2000L ජල ටැංකි 03 ක් පාරිභෝගික ද්‍රව්‍ය යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | 2024 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | තොගය නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.2 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එකතුව රු.1,479,612 ක් වූ ගිණුම් විෂයයන් 06 ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | මෙම ශේෂවලට අදාල ලිපිගොනු, ලේඛන සොයාගත නොහැකි බවත්, ඇතැම් ශේෂ වසර කිහිපයක සිට පැවත එන ශේෂයන් බව. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (1) වගන්තිය | සභා බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශ කාලීනව හඳුනාගෙන වරිපනම් බල ප්‍රදේශය සංශෝධනය කරගත හැකි වුවත්, එපරිදි කටයුතු නොකර 1991 වර්ෂයේදී හඳුනාගත් දියුණු කළ ප්‍රදේශ වලින් පමණක් සමාලෝචිත වර්ෂයේදීද වරිපනම් බදු අයකර තිබුණි. | ඉදිරියේදී දියුණු කළ ගම් ප්‍රදේශ හඳුනා ගෙන වරිපනම් තක්සේරු කටයුතු සිදුකිරීමට කටයුතු කරන බව | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | පළාත් පාලන කොමසාරිස්ගේ (දකුණු පළාත) 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/පපාකො/ 2010/01 දරණ චක්‍රලේඛයේ 02 ඡේදය | සභා කාර්යාල ගොඩනැගිල්ලෙහි දෙවන මහලේ පිහිටි වර්ග අඩි 2860 කින් යුත් කොටසක් 2013 වර්ෂයේ දෙසැම්බර් මස සිට විගණිත දිනය වූ 2024 ජනවාරි 22 දින වන විටත් කිසිඳු කුලියක් අයකිරීමකින් තොරව පෞද්ගලික පාර්ශවයක් වෙත ලබාදී තිබුණි. | තක්සේරු වාර්තාවක් ලබා ගැනීමට තක්සේරු දෙපාර්තමේන්තුව වෙත දැනුම් දුන් බව | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | පළාත් පාලන කොමසාරිස්ගේ (දකුණු පළාත) 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/පපාකො/ 2010/01 දරණ චක්‍රලේඛයේ 04 ඡේදය | කඩ කාමර බදු දීමේදී එක්වන් මුදල් එකවර අයකර ගැනීම හෝ බදුකරුගේ ඉල්ලීම මත මාස 06 ක් ඇතුළත අයකර ගතයුතු වුවත්, ඥාතීන් නොවන බදුකරුවන් වෙත පැවරූ කඩ කාමර 20 කින් ලැබිය යුතු එක්වන් මුදල් රු.5,140,000 ක් අයකර ගෙන නොතිබූ අතර එක්වන් මුදල් අයනොකළ කාලපරාසය වසර 02 ත් වසර 09 ත් අතර විය. | පළාත් පාලන කොමසාරිස් වෙතින් ගැටළුව සඳහා උපදෙස් ඉල්ලා ඇති බව | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.22,895,496 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,077,515 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වෙනත් බදු | 5,200,700 | 5,086,094 | 5,008,395 | 2,718,814 | 4,027,000 | 4,288,942 | 3,402,190 | 2,641,115 |
| කුලී | 13,115,800 | 9,770,509 | 8,397,745 | 3,392,491 | 7,139,280 | 5,679,724 | 5,652,114 | 2,019,727 |
| බලපත්‍ර ගාස්තු | 1,911,200 | 2,104,745 | 1,805,115 | 302,750 | 1,736,000 | 1,378,663 | 1,382,814 | 3,120 |
| වෙනත් ආදායම් | 10,648,200 | 16,525,935 | 21,185,022 | 804,902 | 9,907,450 | 13,090,184 | 10,466,391 | 5,463,989 |
| එකතුව | **30,875,900** | **33,487,283** | **36,396,277** | **7,218,957** | **22,809,730** | **24,437,513** | **20,903,509** | **10,127,951** |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් ඒකක 1294 කින් ලැබිය යුතු බදු රු.2,477,094 ක් හා සභාව සතු කඩ කාමර 24 කින් ලැබිය යුතු කුලී රු.1,483,410 ක් අයකර ගැනීමට ප්‍රාදේශීය සභා පනතේ පිළිවෙළින් 158 (1) සහ 159(1) වගන්ති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | වරිපනම් බදු රු.193,311 හා කඩ කුලී රු.813,557 ක් අයකර ගත් අතර ඉතිරි හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |
| (ආ) | ව්‍යාපාර ඒකක 151 කින් ලැබිය යුතු ව්‍යාපාර හා කර්මාන්ත බදු රු.208,770 ක් 2022 දෙසැම්බර් 09 දිනැති අංක 2310 දරණ ගැසට් නිවේදනය පරිදි 2023 මාර්තු 31 දින වන විට අයකළ යුතු වුවත්, එපරිදි කටයුතු කර නොතිබුණි. | රු.106,560 ක් අයකර ගෙන ඇති බවත්, රු.21,250 ක් කපා හැරීමට ආණ්ඩුකාරවරයාට යොමු කළ බවත්, ඉතිරි හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ඇ) | බෙලිඅත්ත නව වෙළඳ සංකීර්ණයේ දෙවන සහ තෙවන මහල 2016 ජනවාරි 07 දින සිට වසර 30 ක කාලයක් සඳහා බදුකරුවෙකු වෙත බදුදී තිබුණි. දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/පපාකො/2010/01 දරන චක්‍රලේඛයේ අංක 06 ඡේදය අනුව සහ බදු ගිවිසුමේ කොන්දේසි අංක 2.02 අනුව තක්සේරුගත බදු මුදල නව තක්සේරුවක් මඟින් වසර 05 කට වරක් සංශෝධනය කළ යුතු වුවත්, එපරිදි කටයුතු නොකර 2015 ජූලි 13 දිනැති තක්සේරු වාර්තාව මඟින් ලබාදී තිබූ රු.100,000 ක කුලී මුදල මේ වන විටත් අයකරමින් පැවතුණි. තවද ගිවිසුම අනුව මාසික කුලී මුදල අදාළ මාසයේ 10 වෙනි දිනට ප්‍රථම ගෙවීමට කටයුතු කළ යුතු වුවත් එපරිදි කුලී මුදල් ගෙවීමට බදුකරු කටයුතු නොකිරීම නිසා හිඟ ශේෂය රු. 832,500 ක් විය. | තක්සේරුව සඳහා මැනුම් කටයුතු සිදුකර ඇති අතර තක්සේරු වාර්තාව ලැබුණු පසුව ඉදිරි කටයුතු සිදුකරන බවත්, හිඟ කුලී සම්බන්ධව ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව හා බදු ගිවිසුමේ කොන්දේසි අනුව කටයුතු කළ යුතුය. |
| (ඈ) | සභාවට අයත් ධීවර ගොඩනැගිල්ලෙහි පිහිටි මාළු වෙළඳසැල සඳහා රු.9,000 ක මාසික කුලියක් අයකළ යුතු බවට තක්සේරු වාර්තාවක් ලබාදී තිබියදී එපරිදි කටයුතු නොකර රු.5,000 ක මාසික කුලියක් අයකිරීමට සභාව තීරණය කිරීම නිසා 2020 ජනවාරි 29 දින සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා කාලයට අදාළව රු.110,000 ක කුලී මුදලක් සභා අරමුදලට අහිමි වී තිබුණි. | අයකර ගැනීමට කටයුතු කරන බව | සභා අරමුදලට සිදුවූ පාඩුව අදාළ පාර්ශවයන්ගෙන් කඩිනමින් අයකර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | ලැබිය යුතු යන්ත්‍රෝපකරණ කුලී හා වෙළඳ අයිතිය බදු දීමේ කුලී ආදායම් පිළිවෙළින් රු.1,273,489 ක් හා රු.115,959 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | යන්ත්‍රෝපකරණ කුලී රු.128,900 ක් අයකර ගත් බව | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |
| (ඊ) | 2023 වර්ෂයේ ව්‍යාපාර සමීක්ෂණ වාර්තාවේ සඳහන් ස්ථිර දැන්වීම් පුවරු 09 ක් වෙනුවෙන් රු.139,200 ක් අඩුවෙන් බිල්කර තිබුණි. | දැන්වීම් පුවරු සඳහා අඩුවෙන් අයකරන ලද වටිනාකම අයකර ගැනීමට කටයුතු කරන බව. | වාර්ෂික සමීක්ෂණය නිවැරදිව සිදුකර අදාළ ගාස්තු අයකිරීමට කටයුතු කළ යුතුය. |
| (උ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තුව රු.31,401,829 ක් විය. | රු.8,680,257 ක් අයකරගෙන ඇති අතර ඉතිරි හිඟ මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කරන බව. | හිඟ මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බිම් මහල සහ පළමු මහල සහිතව වර්ග මීටර් 270.4 කින් යුත් වානිජ ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා වූ අංක BA/BPS/20/100(U) දරණ ගොඩනැගිලි සැලසුම 2020 නොවැම්බර් 27 දින අනුමත කර තිබුණි. අනුමත සැලසුමේ සඳහන් නොවන දෙවන මහලක් ද ඉදිකර තිබූ අතර දෙවන මහල සඳහා රු.270,400 ක ආවරණ අනුමැතිය ලබාදීමේ ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම රු.5,000 ක ගාස්තුවක් ගෙවා අනුකූලතා සහතිකය ලබාගැනීමකින් තොරව ව්‍යාපාර කටයුතු සිදු නොකළ යුතු වුවත්, බිම් මහළ තුළ ඇති කඩ කාමරවල ව්‍යාපාරික කටයුතු සිදු කරමින් පැවතුණි. | අනවසර ඉදිකිරීම් ඉවත් කරන බවත්, අනුකූලතා සහතික ලබා නොගෙන ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීමට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බව | ආවරණ අනුමැතිය ලබාදීමේ ගාස්තු හා අනුකූලතා ගාස්තු අයකර ගත යුතුය. |
| (ආ) | අංක DS/BPS/22/103(U) දරණ අයදුම් පත්‍රය මඟින් අක්කර 12 පර්චස් 26.68 ක ඉඩමක් අනුබෙදුම් කිරීම සඳහා 2023 පෙබරවාරි 02 දින අනුමත කර තිබුණි. මෙම ඉඩමෙන් සභාවට ලැබිය යුතු රූඩ් 03 යි පර්චස් 31 ක ප්‍රමාණය ඉඩමේ ස්ථාන දෙකකින් ලබාදී තිබූ අතර, එය වාණිජ වටිනාකම අඩු වලවල් සහ ජලය පිරී තිබෙන ස්ථාන වලින් සමන්විත වූයෙන් සැලකිය යුතු වියදමක් දරා සංවර්ධනය කර ප්‍රයෝජනයට ගතහැකි බිම් කොටස් දෙකක් බවට නිරීක්ෂණය වූයෙන් සභා කළමනාකාරීත්වය සභාවට ලැබිය යුතු ඉඩම් කොටස පරීක්ෂාවකින් තොරව | වෙන්දේසිකරු අනවරයෙන් කපා ඇති වළ එම ඉඩමේ කෙළවරට විතැන් කර ඇති බවත්, නීත්‍යානුකූලව ඉඩමේ ඔප්පුව සභාව නමට ලියා ගැනීමට කටයුතු සිදුකරන බව | ඵලදායිව යොදාගත හැකි බිම් කොටසක් වෙන්කරවා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ලබාගැනීම සහ සුදුසු බිම් කොටසක් වෙන්කර ගැනීමට ක්‍රියාකර නොතිබුණි. | | |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී සභාව විසින් වෙළඳ බලපත්‍ර නිකුත් කර තිබූ කර්මාන්ත 07 ක් පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබා නොගැනීම සහ 2019, 2022 හා 2023 වර්ෂයන්හීදී පරිසර ආරක්ෂණ බලපත්‍රයේ වලංගු කාලය ඉක්මවූ කර්මාන්ත ඒකක 30 ක් පරිසර ආරක්ෂණ බලපත්‍රය අලුත් නොකිරීම මත සභාවට ලැබිය යුතු එකතුව රු.183,150 ක පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තු ආදායම් අයකර ගැනීම කෙරෙහි සභා කළමනාකාරිත්වයේ අවධානය යොමු වී නොතිබුණි. | කර්මාන්ත 19 ක් සඳහා අයදුම්පත් ලබාගෙන බලපත්‍ර ලබාදීම සඳහා ඉදිරි කටයුතු සිදුකර ගෙන යන බවත්, අනෙකුත් කර්මාන්ත පරිසර බලපත්‍ර ලබා ගන්නා ලෙස දැනුවත් කර ඇති බව. | ව්‍යාපාර ආයතන පරිසර බලපත්‍ර ලබා ගැනීමට උනන්දු කළ යුතුය. |

## 3.2 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|---|
| (අ) | මාස 84 ත් හා මාස 108 ත් අතර කාලයක සිට ධාවනයෙන් ඉවත් කළ වාහන 02 ක් අළුත්වැඩියාකර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු නොකර රථ විවෘත භූමියේ ගාල්කර තිබීමෙන් දිරාපත් වීමට ලක්වෙමින් පැවතුණි. | කැබ්රථ දෙක අපහරණය සඳහා නිර්දේශ කර ඇති අතර එම කටයුතු කඩිනමින් අවසන් කිරීමට කටයුතු කරන බව | වාහන අපහරණය කිරීම හෝ අලුත්වැඩියාකර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ඉඩම් හා ගොඩනැගිලි 28 ක නීත්‍යානුකූල අයිතිය සභාව වෙත පවරා ගැනීමට සමාලෝචිත වර්ෂයේ අවසානය වනවිටත් කටයුතු කර නොතිබුණි. | ඉඩම් 09 ක අයිතිය පවරා ගෙන අවසන්ව ඇති අතර ඉතිරි ඉඩම් පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව. | වත්කම්වල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කඩිනමින් පියවර ගත යුතුය. |

## 3 ව්‍යාපෘති, කතර්ව්‍යන් හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| 2023 වර්ෂයේ අයවැය ලේඛනයේ ඇතුළත් එකතු වටිනාකම රු.6,500,000 ක් වූ සංවර්ධන යෝජනා 10 ක් සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. | සංවර්ධන යෝජනා 05 ක් සමාලෝචිත වර්ෂයේදී ඉටුකර ඇති බව | අයවැය මගින් ප්‍රතිපාදන වෙන්කර ඇති සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කළ යුතුය. |

## 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|---|
| (අ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6.1 (අ) වගන්තිය අනුව ප්‍රසම්පාදනය කිරීමට ඇති භාණ්ඩ හෝ වැඩ සඳහා වූ පිරිවිතර ප්‍රසම්පාදන අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා අවශ්‍ය ප්‍රමාණයට වඩා පටු ආකාරයට විස්තර නොකළ යුතු වුවත්, එකතු වටිනාකම රු.580,000 ක් වූ ටයර් හා ටියුබ් මිලදී ගැනීම සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි. | ප්‍රසම්පාදන විෂයෙහි පැවති බොහෝ අඩුපාඩු හඳුනාගෙන නිවැරදි කරගෙන ඇති බව | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.11 වගන්තිය අනුව වීපී පහන් කට්ටල මිලදී ගැනීමේදී තාක්ෂණික ඇගයීම් කමිටුවක නිර්දේශ ලබාගත යුතු වුවත්, එපරිදි කටයුතු නොකර වටිනාකම රු.355,000 ක් වූ කෝබ්‍රා වීපී පහන් 20 ක් මිලදී ගෙන තිබුණි. | ප්‍රසම්පාදන කමිටුවෙහි සාමාජිකයින් ලෙස තාක්ෂණික නිලධාරීන් දෙනෙකු සිටින අතර මෙම ප්‍රසම්පාදනය සඳහා වූ තාක්ෂණික ඇගයීම් කමිටුව බව ඔවුන් දායක වී ඇති බව | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.8 වගන්තියේ සඳහන් විධිවිධාන වලින් බැහැරව සිසු නිපුණතා වැඩසටහන සඳහා ත්‍යාග ලබාදීමට එකතු වටිනාකම රු.98,810 ක් වූ පිටු 120 CR පොත් 902 ක් හා පිටු 80 CR පොත් 82 ක් මිලදීගෙන තිබුණි. | පළාත් පාලන කොමසාරිස්ගේ ලිඛිත උපදෙස් පරිදි කටයුතු කළ බව | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

**3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | කොට්ගොඩැල්ල D.A රාජපක්ෂ ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීමේ කර්මාන්තය සඳහා මිල වැඩිවීම් ලෙස රු.161,439 ක් ගෙවීම් කර තිබුණද මිල වැඩිවීම් ලෙස ගෙවිය හැකි මුදල රු.79,574 ක් වූයෙන් වැඩිපුර ගෙවා තිබූ මුදල රු.81,865 ක් විය. | රැඳවුම් මුදලින් අයකර ගන්නා බව | වැඩිපුර ගෙවීම් අයකර ගත යුතුය. |
| (ආ) | එකතු වටිනාකම රු.3,997,652 ක් වූ මාර්ග සංවර්ධන ව්‍යාපෘති 04 කට අදාළව ඉදිකිරීම් කටයුතු නිමකර තිබුණද එම ව්‍යාපෘතිවල මාර්ගය මත ගල්කුඩු යොදා නොතිබීම, කොන්ක්‍රීට් බැම් වලට සමාන්තරව මාර්ගය මත ගල් අතුරා නොතිබීම, මාර්ගය මත ගල් අතුරා තිබූ කොටස්වල ඇතැම් ස්ථානවල කොන්ක්‍රීට් බැම් වලට වඩා උසින් වැඩි වන හා උසින් අඩුවන පරිදි අවිධිමත්ව ගල් අතුරා තිබීම සහ කොන්ක්‍රීට් බැම් හා ගල් අතුරා ඇති කොටස් අතර පවතින හිඩැස් පිරවීමට කටයුතු නොකිරීම යන අඩුපාඩු නිරීක්ෂණය පැවතුණි. | නිරීක්ෂණය පිළිගන්නා බව | ඉදිකිරීම් කටයුතු නියමිත ප්‍රමිතියට අනුව සිදු කිරීමෙන් පසුව ගෙවීම් කළ යුතුය. |
| (ඇ) | සභා අරමුදලින් 2023 වර්ෂයේදී ක්‍රියාත්මක කර තිබූ කර්මාන්ත සඳහා කැටගල් ලබාගත හැකි ස්ථාන හඳුනාගෙන එම ස්ථානය සහ කර්මාන්තය පිහිටි ස්ථානය අතර තිබූ දුර සැලකිල්ලට ගෙන ප්‍රවාහන වියදම් ගණනය කර ගෙවීම් කිරීමට කටයුතු කළ යුතු වුවත්, එපරිදි කටයුතු නොකර වැඩනිම කර තිබූ කර්මාන්ත 06 ක් සඳහා කිලෝමීටර් 20 ක දුරකින් කැටගල් ප්‍රවාහනය කරන බවට දක්වමින් ඇස්තමේන්තු සකස් කර රු.298,073 ක් ගෙවීම් කර තිබුණද කොන්ක්‍රීට් කැටගල් මිලදීගත් ස්ථානය හා දුර ප්‍රමාණය පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | කැටගල් මිලදීගත් ස්ථාන හා දුර ප්‍රමාණයන් අදාළ කොන්ත්‍රාත් සමිති වලින් විමසා ඇති අතර ඒවා ලද පසු විගණනයට ඉදිරිපත් කරන බව | කැටගල් ප්‍රවාහනය කළ දුර ප්‍රමාණය නිශ්චිතව තහවුරු කරගෙන ගෙවීම් කළ යුතුය. |

### 3.6 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| සභාවේ අනුමත හා තථ්‍ය කාර්යය මණ්ඩලය පිළිවෙලින් 91 ක් හා 103 ක් වූයෙන්, තනතුරු 05 කට අදාළ අතිරික්තතා 25 ක් විධිමත්කර ගැනීමට සමාලෝචිත වර්ෂයේ අවසානය වනවිටත් කටයුතු කර නොතිබුණි. | සේවක අතිරික්තතා සම්බන්ධයෙන් ලැබෙන උපදෙස් අනුව කටයුතු කරන බව | කාර්ය මණ්ඩලයේ අතිරික්තතා විධිමත්කර ගැනීමට කටයුතු කළ යුතුය. |